සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01 කුසුමාසන දේවිය විවාහ කර ගැනීමෙන් උඩරට රාජධානියේ රාජ්‍ය උරුමය නීත්‍යානුකූලව තහවුරු කරගත් රජතුමා
(1) දෙවන විමලධර්මසූරිය (2) දෙවන රාජසිංහ
(3) පළමුවන විමලධර්මසූරිය (4) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

02 සද්ධර්මරත්නාවලිය, පූජාවලිය හා කඳවුරු සිරිත යන ග්‍රන්ථ රචනා වී ඇත්තේ,
(1) ගම්පල රාජධානි යුගයේ ය. (2) දඹදෙණි රාජධානි යුගයේ ය.
(3) කුරුණෑගල රාජධානි යුගයේ ය. (4) කෝට්ටේ රාජධානි යුගයේ ය.

03 අටවෙනි වීර පරාක්‍රමබාහු නමින් කෝට්ටේ රජ බවට පත්වූයේ,
(1) සපුමල් කුමාරයා ය. (2) අම්බුලුගල කුමාරයා ය.
(3) කැකුලන්දල සිරිවර්ධන පතිරාජයන් ය. (4) නිශ්ශංක අලගක්කෝනාර ය.

04 ගම්පල රාජධානි යුගය සම්බන්ධ නිවැරදි ප්‍රකාශයක් වන්නේ,
(1) චෙන් හෝ නම් සෙන්පතියකු විසින් අලකේශ්වර සිරහාරයට ගෙන චීනයට ගෙනයාම.
(2) යාපනය රාජධානිය සපුමල් කුමාරයා ලවා ගම්පල රාජ්‍යයට යටත්කර ගැනීම.
(3) චෝඩගංග, කාලිංගරායර් යන ආක්‍රමණිකයින්ගේ පැමිණීම.
(4) බෙලිගල පර්වතය මුදුනේ දළදා මාළිගයක් තැනවීම.

05 අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා වූයේ,
(1) හතරවන උදය රජතුමා (2) පස්වන මිහිඳු රජතුමා
(3) හතරවන දප්පුල රජතුමා (4) තුන්වෙනි අග්බෝ රජතුමා

06 ''වල්වල දඬුපත් නොකපනු ඉසා'' යන ප්‍රකාශය සඳහන් වන්නේ,
(1) අනුරාධපුරයේ බුද්දන්නෙහෙල නම් ස්ථානයේ ඇති සෙල්ලිපියකයි.
(2) කොන්ඩවට්ටවාන් නම් ස්ථානයේ ඇති ටැම් ලිපියකයි.
(3) උඩ රංචාමඩම නම් ස්ථානයේ ඇති සෙල්ලිපියකයි.
(4) අභයගිරි විහාර කැණීම් වලින් සොයාගත් තඹ තහඩුවකයි.

07 හතරවන මිහිඳු රජතුමාගේ වේවැල්කැටිය සෙල් ලිපියට අනුව හරක් සොරකම් කර අසුවන අයට දුන් දඬුවම නම්,
(1) එල්ලා මැරීම
(2) දඬුකඳේ ගැසීම
(3) සොරාගත් සතුන් අයිතිකරුවන් සොයා ගොස් බාරදීමට නියම කිරීම.
(4) හරකාගේ ශරීරයේ තිබෙන මුද්‍රාව, සොරාගේ නළලේ තැබීමට නියම කිරීම.

08 දකපති, බොජකපති හා මතරමජිබක යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) අතීතයේ නීති උල්ලංඝනය කළවුන්ට පැමිණවූ දඬුවම් වර්ග 3 කි.
(2) බදු නීතිය යටතේ අය කළ ප්‍රධාන බදු වර්ග 3 කි.
(3) නීතිය ආරක්ෂා කිරීම සඳහා පත් කර සිටි නිලධාරීන් තිදෙනෙකි.
(4) රජතුමාට සේවය සැපයූ රජ මාළිගාවේ නිලධාරීන් තිදෙනෙකි.

09 ජේතවන විහාර කැණීම්වලින් හමුවී තිබෙන රන් තැල්ලෙන් අපට එළඹිය හැකි නිගමනයක් වන්නේ,
(1) එකල ජනයාගෙන් වැඩි පිරිසක් රන් ආභරණ පාවිච්චි කළ බවයි.
(2) රන් ආභරණ තැනීම පිළිබඳව උසස් තාක්ෂණයක් තිබී ඇති බවයි.
(3) වෙනත් ලෝහ වර්ගවලින් ආභරණ තැනීම එතරම් ජනප්‍රිය නොවූ බවයි.
(4) රන් ආභරණ කර්මාන්තයට අභියෝගයක් විය හැකි වෙනත් කර්මාන්ත කිසිවක් නොතිබූ බවයි.

10 හේමමාලා කුමරිය හා දන්ත කුමරු දළදා වහන්සේ රැගෙන මෙරටට ගොඩබැස්සේ

(1) උතුරු වෙරළේ ජම්බුකෝළ පට්ටන වරායෙනි.

(2) බටහිර වෙරළේ මාතොට වරායෙනි.

(3) නැගෙනහිර වෙරළේ ලංකා පට්ටන වරායෙනි.

(4) දකුණු වෙරළේ ගොඩවාය වරායෙනි.

11 ''නානාදේසී'' , ''වලඤ්ඤියාර්'' , ''අයින්නූරුවර්'' යනුවෙන් සෙල්ලිපිවල සඳහන් වන්නේ,

(1) ලංකාවට පැමිණි ඉන්දියානු සම්භවයක් ඇති වෙළඳ සංවිධාන කිහිපයක් ගැනයි.

(2) ලංකාවට පැමිණි ද්‍රවිඩ වෙළෙඳුන් කිහිප දෙනෙක් ගැනයි.

(3) ගිණිකොණ ආසියාවේ පැවැති වරායයන් තුනක් ගැනයි.

(4) හෝපිටිගමු පදියේ රාජකාරි කළ වෙළෙඳුන් තිදෙනෙක් ගැනයි.

12 ගෘහණියක් එළදෙනකගෙන් කිරි දෝවනය කරන ආකාරය දැක්වෙන කැටයමක් හමුවී ඇත්තේ,

(1) සීගිරියේ නාගපබ්බ විහාර ස්තූපයේ ධාතු ගර්භයෙනි.

(2) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මණ්ඩගල ස්ථානයෙන් හමුවූ සෙල්ලිපියකිනි.

(3) මාගම්පුර දකුණු දොරටුව අසල තිබූ වෙළඳපළකිනි.

(4) වෙහෙරකෙම නම් ස්ථානයේ ගල් ගුහාවකිනි.

13 ධාතුසේන රජතුමාගෙන් පසුව කාශ්‍යප කුමරුට රාජ්‍යය පිළිබඳව නීත්‍යානුකූල උරුමයක් හිමි නොවූයේ,

(1) කාශ්‍යප කුමරුගේ මව ධාතුසේන රජුගේ දෙවන බිසවක් වූ නිසාය.

(2) මවගේ සහෝදරයා හා රජතුමා අතර ගැටුම් පැවතීම නිසාය.

(3) අගබිසවට ලැබුණු වැඩිමහල් පුතුන් සිටීම නිසාය.

(4) රජතුමාට රාජ්‍යය උරුම කරදීමට වැඩිමහල් සොහොයුරකු සිටීම නිසාය.

14 සමස්ථ ශ්‍රී ලංකාවම පරිපාලන දිස්ත්‍රික්කවලට වෙන්කොට එක් එක් දිස්ත්‍රික්කවල පාලනයට මුලින්ම ඇමතිවරුන් පත් කරන ලද්දේ

(1) දුටුගැමුණු රජතුමා ය. (2) වංකනාසිකතිස්ස රජතුමා ය.

(3) කුටකණ්ණතිස්ස රජතුමා ය. (4) වසභ රජතුමා ය.

15 ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීමේ උත්සවයට විවිධ ප්‍රදේශවලින් ප්‍රාදේශීය පාලකයින් කැඳවීමට දේවානම්පියතිස්ස රජතුමා ක්‍රියා කළේ

(1) තමා මුළු රටේම රජු බවට ප්‍රාදේශීය පාලකයින් තුළ අවධාරණය කිරීම සඳහා ය.

(2) ප්‍රාදේශීය පාලකයින් තුළ සුහදතාව වර්ධනය කිරීම සඳහා ය.

(3) ඉන්දියාව අනුගමනය කරන ක්‍රියාමාර්ග තමන් ද අනුමත කරන බව දැනුම්දීම සඳහා ය.

(4) ප්‍රාදේශීය පාලකයින් අතර පැවැති විරෝධතා මර්දනය කිරීම සඳහා ය.

16 අනුරාධපුර නගරය හැඳින්වීමට ''නුරුපුර'' යන වචනය ව්‍යවහාර කර තිබෙන්නේ,

(1) පනාකඩුව තඹ සන්නසේ ය. (2) වල්ලිපුරම් රන්පතේ ය.

(3) ගල්පොත සෙල්ලිපියේ ය. (4) ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශයේ ය.

17 දේශීය සාහිත්‍යමය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම මූලාශ්‍රය වන්නේ,

(1) මහාවංශයයි. (2) දීපවංශයයි. (3) බෝධිවංශයයි. (4) රාජාවලියයි.

18 ශ්‍රී ලංකාව පිළිබඳව ලියැවී ඇති විදේශීය මූලාශ්‍ර අතර අරාබි, චීන හා ඉංග්‍රීසි මූලාශ්‍ර වන්නේ පිළිවෙළින්,

(1) ඉබන් බතුතාගේ දේශාටන වාර්තා, එදා හෙළදිව, පාහියන් හිමිගේ වාර්තා

(2) ඉබන් බතුතාගේ දේශාටන වාර්තා, පාහියන් හිමිගේ වාර්තා, එදා හෙළදිව

(3) ඩිමුන්ඩෝ, රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, නැවුරාලිස් හිස්ටෝරියා

(4) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, ටොලමිගේ ලංකා සිතියම, එදා හෙළදිව

19 ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික ජනයාගේ ජීවිතය පිළිබඳව වැදගත් තොරතුරු අනාවරණය වන ස්ථානයක් වන්නේ,

(1) සීගිරිය පොතාන නම ස්ථානයයි. (2) අත්තනගොඩ අළු ලෙනයි.

(3) කිතුල්ගල බෙලිලෙනයි. (4) බුලත්සිංහල පාහියන්ගල ලෙනයි.

20 ඉරණමඩු සැකැස්ම යනුවෙන් පුරා විද්‍යාඥයින් විසින් හඳුන්වා ඇත්තේ,

(1) ප්ලයිස්ටොසීන යුගයට අයත් අධික වර්ෂා කාලවල තැන්පත් වූ බොරළු සහිත පස් තට්ටුවකි.

(2) අර්ධ ශුෂ්ක කලාපයේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරළු පස් තට්ටුවකි.

(3) හෝමෝ සේපියන් මානවයා දඩයමින් හා ආහාර රැස් කිරීමෙන් ජීවත් වූ ප්‍රදේශයකි.

(4) රත්නපුර හා අවට ප්‍රදේශවලින් හමුවන ඉල්ලම් පස් තට්ටුවකි.

21 අලිගල, පොතාන හා පිදුරන්ගල යන ස්ථාන පිළිබඳව නිවැරදි ප්‍රකාශයක් වන්නේ,

(1) පහතරට වියළි කලාපයට අයත් පැරණි වාසස්ථාන පැවැති ස්ථාන වීම.

(2) පහතරට තෙත් කලාපයට අයත් පැරණි වාසස්ථාන පැවැති ස්ථාන වීම.

(3) ගල් යුගයේ ජනයා ජීවත් වූ බවට තොරතුරු හමුවී තිබෙන අර්ධ ශුෂ්ක කලාපයට අයත් ස්ථාන වීම.

(4) අතරමැදි වියළි කලාපයේ ප්‍රාග් ඓතිහාසික ජනයා ජීවත් වූ ස්ථාන වීම.

22 ශ්‍රී ලංකාව හා චීනය අතර ඉතා ශක්තිමත් ලෙස සම්බන්ධතා ගොඩනගාගත් පාලකයකු වන්නේ,

(1) හයවන අග්ගබෝධි රජතුමා (2) පළමුවන ගජබා රජතුමා

(3) පළමුවන විජයබාහු රජතුමා (4) භාතිකාභය රජතුමා

23 පළමුවන උපතිස්ස රජතුමා විසින් ''පසවන්ති නාම සාලා'' නම් ගොඩනැගිලි විශේෂයක් කරවූ බව සෙල්ලිපිවල සඳහන් වේ. මෙහි ''පසවන්ති නාම සාලා'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) බ්‍රාහ්මණයින්ගේ ආගමික කටයුතු ඉටුකිරීම පිණිස සකස් කරන ලද ස්ථානයි.

(2) ගැබිණි මව්වරුන්ට දරු ප්‍රසූතිය පිණිස කරවූ ගොඩනැගිලි විශේෂයකි.

(3) පොදු සෞඛ්‍ය පහසුකම් නගාසිටුවීම පිණිස ඇතිකළ රෝහල් වර්ගයකි.

(4) දරුණු උණ රෝගයකට ප්‍රතිකාර කිරීම පිණිස තැනවූ ගොඩනැගිලිය.

24 හේන් ගොවිතැන පැරණි ගැමියන්ගේ ප්‍රධාන ජීවන මාර්ගයක් විය. ''නව දූලිහේන'' යනුවෙන් හඳුන්වන්නේ,

(1) අලුතින් ගිනි තබා සකස් කරගත් හේනකි.

(2) පැළෑටි වර්ග නවයක් දළු ලා සරුවට වැඩුණු හේනකි.

(3) කාලයක් අතහැර දමා යළිත් වගා කිරීම ආරම්භ කරන හේනකි.

(4) දඬු වැටකින් ආරක්ෂා සහිතව වගා කරන හේනකි.

25 ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණ අවස්ථාවේ බිහිවූ නගර පිළිබඳව සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,

(1) වැඩි නගර සංඛ්‍යාවක් නිරිතදිග ප්‍රදේශය ආශ්‍රය කරගෙන වර්ධනය විය.

(2) දේශපාලන බලය විමධ්‍යගත වීම නිසා පාලන මධ්‍යස්ථාන කීපයක් ඇතිවිය.

(3) නව වෙළඳ සම්බන්ධතා ජාලයක් නිර්මාණය විය.

(4) දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා රාජධානි පරිහානියට පත්විය.

26 දැදිගම සෙල්ලිපියේ සඳහන් වන තොරතුරුවලට අනුව එය

(1) සිංහල සංඝයේ වැරදිකරුවන්ට සමාව දෙමින් පිහිටවූ අභයදාන සෙල්ලිපියකි.

(2) ස්වාධීන පාලකයින් ලෙස කටයුතු කළ වන්නියාර්වරුන් අවනත කරගැනීම පිළිබඳව තොරතුරු සඳහන් වන සෙල්ලිපියකි.

(3) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ට ප්‍රදානය කළ ගම්වර පිළිබඳව තොරතුරු ඇතුළත් සෙල්ලිපියකි.

(4) වික්‍රමබාහු හා ජයවීර බණ්ඩාර රජවරුන් අතර ඇතිකරගත් සම්මුතියක් පිළිබඳව තොරතුරු සඳහන් සෙල්ලිපියකි.

27 උඩරට රාජධානියේ නව රාජවංශයක් ආරම්භ කරමින් පළමුවන විමලධර්මසූරිය නමින් රජ බවට පත්වූයේ,

(1) උඩරට ජයවීර බණ්ඩාරගේ පුත්‍රයා ය.

(2) උඩරට වීරසුන්දර බණ්ඩාරගේ පුත්‍රයා ය.

(3) උඩරට කොනප්පු බණ්ඩාරගේ පුත්‍රයා ය.

(4) සේනාසම්මත වික්‍රමබාහුගේ පුත්‍රයා ය.

28 කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ පාලන කාලය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශයක් වන්නේ,

(1) බිසවගේ සහෝදරයාට සිංහාසන උරුමය හිමිවිය.

(2) ඉංග්‍රීසිහු මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලාගැනීම සිදුවිය.

(3) වැලිවිට සරණංකර හිමියන්ගේ මූලිකත්වයෙන් රට පුරා බෞද්ධ ආගමික ප්‍රබෝධයක් සිදුවිය.

(4) වසර 50 ක පමණ කාලයක් උඩරට රාජ්‍යය පාලනය කළේය.

29 උඩරට රාජධානි සමයේ මහවාසල හා සම්බන්ධ නිලධාරීන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) දියවඩන නිළමේ, බත් වඩන නිළමේ, ගජනායක නිළමේ හා සළුවඩන නිළමේ

(2) ලියන රාළ, උන්ඩිය රාළ, රටේ රාළ, ගජනායක නිළමේ

(3) දිසාවේ, රටේ මහත්වරු, බත්වඩන නිළමේ, ගජනායක නිළමේ

(4) මහ අධිකාරම්, දිසාවේ, රටේ මහත්වරු, සේනානායක නිළමේ

30 මහනුවර රාජධානි සමයේ රදළ ප්‍රධානීන් විසින් කරන ලද සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් හඳුන්වන ලද්දේ,

(1) ගබඩාගම් වශයෙනි. (2) පරවේණි ඉඩම් වශයෙනි.

(3) විහාර දේවාලගම් වශයෙනි. (4) නින්දගම් වශයෙනි.

31 ක්‍රිස්ටෝෆර් කලම්බස්ට දේශ ගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහය ලැබුණේ

(1) පෘතුගාලයේ නාවික හෙන්රි කුමාරයාගෙනි.

(2) ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් රජතුමාගෙන් හා ඉසබෙලා රැජිනගෙනි.

(3) එංගලන්තයේ අටවෙනි හෙන්රි රජතුමාගෙනි.

(4) ඕලන්දයේ පස්වෙනි විලියම් රජතුමාගෙනි.

32 දෙවෙනි විමලධර්මසූරිය, ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ යන රජවරුන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශයක් වනුයේ,

(1) ලංදේසීන්ට අයත් වෙරළබඩ ප්‍රදේශවලට වරින් වර පහරදී ඇත.

(2) ලංදේසීන් සමග සාම ගිවිසුම් අත්සන් කර ඇත.

(3) උපසම්පදාව ගෙන්වීම පිණිස ලංදේසීන්ගෙන් නැව් ලබාගෙන ඇත.

(4) ලංදේසීන්ට විරුද්ධව කැරලි ගැසීමට පහතරට ජනයාට උදව් දී ඇත.

33 1630 රන්දෙනිවෙල සටන, 1638 ගන්නොරුවේ සටන යන උඩරට ආක්‍රමණ මෙහෙයවන ලද පෘතුගීසි කපිතාන්වරුන් නම්

(1) කොන්ස්තන්තීනු ද සා සහ පේරෝ ලෝපේස් ද සූසා

(2) ජෙරනිමෝ ද අසවේදු සහ දියොගු ද මේලෝ

(3) පේරෝ ලෝපේස් ද සූසා සහ කොන්ස්තන්තීනු ද සා

(4) කොන්ස්තන්තීනු ද සා සහ දියොගු ද මේලෝ

34 ආසියානු රටකදී පෘතුගීසීන් දරුණුතම පරාජයක් ලැබුවේ ශ්‍රී ලංකාවේදී ය. එම සටන සිදුවූයේ,

(1) 1602 බලනේ දී (2) 1638 ගන්නොරුවේ දී

(3) 1630 රන්දෙනිවෙල දී (4) 1562 මුල්ලේරියා වෙලේ දී

35 නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කලක් කෝට්ටේ මහ සෙනෙවියකු වූ වීදිය බණ්ඩාර මරණයට පත්වූයේ යාපනයේ දී ය.

(2) මායාදුන්නේගේ පුත් ටිකිරි බණ්ඩාර දෙවන රාජසිංහ නමින් සීතාවක රජවිය.

(3) පෙතන්ගොඩ උයනේ දී නපුරු උණ කටුවක් ඇනී පළමුවන විමලධර්මසූරිය රජතුමා ජීවිතක්ෂයට පත්විය.

(4) සීතාවක රාජසිංහ රජු 1582 දී උඩරට අල්ලාගත්තේ වීරසුන්දර මුදලි මරණයට පත්කිරීමෙනි.

36 චිත්‍ර ශිල්පියෙක් පමණක් නොව කවියෙක් ද, සංගීතඥයෙක් ද, ප්‍රායෝගික ඉංජිනේරුවරයකු ද වූ පුද්ගලයා වන්නේ,

(1) ලියනාඩෝ ඩාවින්චි (2) මයිකල් ඇන්ජිලෝ

(3) මැසෙක්සියෝ (4) ලොරෙන්සෝ මෙඩිචි

37 පහත A තීරුවේ දක්වෙන්නේ උඩරට රාජධානි සමයේ ක්‍රියාත්මක වූ බදු වර්ග කීපයකි. B තීරුවේ කාර්යයන් සමග ඒවා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1. | කුරුවෙ බද්ද | A | භාණ්ඩ ප්‍රවාහනය |
| 2. | බඩහැල බද්ද | B | රෙදි සේදීම |
| 3. | මඩිගෙ බද්ද | C | වළං තැනීම |
| 4. | රදා බද්ද | D | අලිඇතුන් ඇල්ලීම |

(1) D A C B (2) D B A C (3) D C A B (4) A C B D

38 රයිගම හා දෑදිගම යන ස්ථානවලත් ප්‍රාදේශීය පාලන ඒකක ක්‍රියාත්මක වූයේ,

(1) කුරුණෑගල රාජධානි සමයේ දී (2) ගම්පල රාජධානි සමයේ දී

(3) දඹදෙනි රාජධානි සමයේ දී (4) යාපහුව රාජධානි සමයේ දී

39 පොළොන්නරු යුගය වන විට මෙරට වාස්තු විද්‍යාත්මක නිර්මාණවල අග්නිදිග ආසියාතික ලක්ෂණ දක්නට තිබූ බවට උදාහරණයක් ලෙස ගත හැක්කේ,

(1) නිශ්ශංකලතා මණ්ඩපයයි. (2) සත්මහල් ප්‍රාසාදයයි.

(3) පබළු වෙහෙරයි. (4) අටදාගෙයයි.

40 තුන්වෙනි විජයබාහු රජතුමාගෙන් ඉටුවූ සේවාවක් නොවන්නේ,

(1) බෙලිගල පර්වතය මුදුනේ දළදා මැඳුරක් කරවීම.

(2) කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවීම.

(3) ගෝවින්ද මලයෙහි බලකොටුවක් තැනවීම.

(4) උපසම්පදා උත්සවයක් පවත්වා සංඝ සංශෝධනයක් ඇතිකිරීම. (2 x 40 = 80)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

01 (අ) (1) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම ප්‍රයෝජනයට ගෙන පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. (ල. 10)

කොට්ටියාරම / මල්වාන / ගම්පල / මහවැලි ගඟ / ගොඩවාය / පල්ලව වංක/ ජම්බුකෝළ පට්ටන / බටදොඹ ලෙන / අරුවිආරු / මහනුවර

(2) සපයා ඇති ලෝක ආකෘති සිතියම ප්‍රයෝජනයට ගෙන පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. (ල. 08)

රෝමය / අයිබීරියන් අර්ධද්වීපය / කැලිකට් / රතු මුහුද / කොන්ස්තන්තිනෝපල් / ස්පාඤ්ඤය / ෆ්ලෝරන්ස් / බටහිර ඉන්දීය දූපත්

(ආ) පහත A B C D වශයෙන් දක්වා ඇති ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න. (ල. 04)

(කීර්ති ශ්‍රී රාජසිංහ / ශ්‍රී වික්‍රම රාජසිංහ / පළමුවන විමලධර්මසූරිය / පළමුවන විජයබාහු / කීර්ති නිශ්ශංකමල්ල / දෙවන රාජසිංහ)

A ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන දීර්ඝතම සෙල්ලිපිය වන ගල්පොත සෙල්ලිපිය ලියවීම.

B පොළොන්නරුව සොළී පාලනයෙන් නිදහස් කරගැනීම.

C සියම් දේශයෙන් භික්ෂූන් වහන්සේලා ගෙන්වා උපසම්පදාව පිහිටුවීම.

D දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දළදා වහන්සේ මහනුවරට වැඩම වීම.

(ඇ) පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.


A


B


C

(1) (a) A අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

(b) එය හමුවී තිබෙන්නේ කවර ස්ථානයකින් ද?

(c) මෙයට තෙල් පිරවීම පිණිස යොදාගෙන තිබෙන මූලධර්මය කුමක් ද?

(2) (a) B අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය හමුවී තිබෙන්නේ කවර ස්ථානයකින් ද?

(b) එය කවර කාල වකවානුවකට අයත් සේ සලකනු ලැබෙන්නේ ද?

(c) මෙම නිර්මාණය නිසා තහවුරු වන කරුණක් ලියන්න.

(3) (a) C අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(b) කවර රාජධානි යුගයකට එය අයත්වේ ද? (ල. 08)

02 (1) මෙරට අතීතයේ දී ජල කළමනාකරණය සම්බන්ධයෙන් ඉහළම තාක්ෂණයක් භාවිත වූ බව එකල තනා තිබෙන වැව් වලින් තහවුරු වේ. අනුරාධපුර යුගයට අයත් එවැනි වැව් 3 ක් සඳහන් කරන්න.

(2) එකල අවකාශය මැනීමට යොදාගත් මිනුම් 2 ක් හා බර මැනීමට යොදාගත් මිනුම් 2 ක් බැගින් සඳහන් කරන්න.

(3) එකල යකඩ නිස්සාරණය සඳහා යොදාගෙන තිබුන තාක්ෂණය ස්වභාවධර්මයේ සිදුවීම් හා කෙතරම්දුරට සම්බන්ධ වූයේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(4) වැවක ආරක්ෂාව සඳහා ඉදිකර තිබෙන ප්‍රධාන අංග 3 ක් දක්වා ඒවායින් වැවේ ආරක්ෂාවට සැලසෙන සේවය වෙන වෙනම විමසන්න.

03 (1) රද්කොල් සම්දරු / කුඩීන් / අන්වයාතදස යන නම්වලින් අතීතයේ හඳුන්වා ඇති පුද්ගලයින් කවුරුන්දැයි පිළිවෙළින් නම් කරන්න.

(2) එකල නීතිය හා සම්බන්ධ කටයුතුවලදී ''වදාළ'' හා ''සභාව'' යනුවෙන් අදහස් කරන ලද්දේ මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) බදුලු ටැම් ලිපියට (සොරබොර වැව ලිපියට) අනුව එකල මෙරටේ පැවැති අභ්‍යන්තර වෙළඳාම හා ඊට අදාළ නීති ගැන විස්තර කරන්න.

(4) එකල ජනයා ආහාර පාන සකස් කරගත් ආකාරය, ඒ සඳහා යොදාගත් ක්‍රම ශිල්ප, සකස් කරගත් ආහාර වර්ග පිළිබඳව වෙන වෙනම විස්තර කරන්න.

04 (1) (a) දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා වීම.

(b) ඊජිප්තුවට තානාපතිවරුන් යැවීම.

(c) කෝට්ටේ බලකොටුවක් තනවා ආර්ය චක්‍රවර්තිගේ අයකැමියන් පළවා හැරීම.

ඉහත කාර්යයන් හා සම්බන්ධ රජවරුන් පිළිවෙළින් නම් කරන්න.

(2) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපා තිබෙන කරුණු 2 ක් සඳහන් කරන්න.

(3) තම රාජ්‍යයට එල්ල වූ සතුරු ආක්‍රමණවලට සාර්ථකව මුහුණ දුන් දඹදෙනි රජතුමා නම්කර එතුමා ඒ සඳහා ක්‍රියාකළ ආකාරය පැහැදිලි කරන්න.

(4) කෝට්ටේ රාජධානි යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සලකනු ලබන්නේ මන්දැයි කරුණු 3 ක් ආශ්‍රයෙන් පහදන්න.

05 (1) මහනුවර රාජධානි යුගයේ දී රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ග 3 ක් සඳහන් කරන්න.

(2) එකල වරද කළවුන්ට දුන් දඬුවම් වර්ග 4 ක් ලියා දක්වන්න.

(3) මහනුවර රාජධානි සමයේ පරිපාලන සංවිධානයට අයත්ව පැවැති කොටස් නම් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න.

(4) දෙවන රාජසිංහ රජතුමාට රාජ්‍ය බලය ආරක්ෂාකර ගැනීම පිණිස මුහුණ දීමට සිදුවූ අභියෝග 3 ක් වෙන වෙනම විස්තර කරන්න.

06 (1) පුනරුද සමයේ යුරෝපා රටවල සාහිත්‍යමය වශයෙන් විශිෂ්ට සේවාවක් ඉටුකළ ගත් කතුවරුන් තිදෙනෙක් නම් කරන්න.

(2) පහත දැක්වෙන්නේ එකල සොයා දැනගත් නව අදහස් කීපයකි. එම සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙලින් නම් කරන්න.

(a) පෘථිවිය ඇතුළු ග්‍රහලෝක සියල්ල සූර්යයා වටා ඉලිප්සාකාරව භ්‍රමණය වන බව

(b) චන්ද්‍රයා මතුපිට ආවාට ඇති බව

(c) රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව තොරතුරු සොයා දැනගැනීම

(d) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

(3) පුනරුද සමයේ නව වෙළඳ මාර්ග සොයාගැනීමට සම්බන්ධ වූ පුද්ගලයින් ඔවුන් සොයාගන්නා ලද ප්‍රදේශ ද ඇතුළත් වන පරිදි විස්තරයක් ලියන්න.

(4) මධ්‍යතන යුගයේ අවසාන භාගයේ යුරෝපා රටවල පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 3 ක් විස්තර කරන්න.

07 (1) පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් බෙදී පැවති කොටස් නම් කරන්න.

(2) (a) 1521 න් පසුව කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන වශයෙන් බෙදීමක් ඇතිවීමට බලපෑ හේතුව කුමක් ද?

(b) එසේ බෙදීගිය කොටස් නම් කරන්න.

(3) ''කෝට්ටේ රාජ්‍යය තුළ පැවැති අභ්‍යන්තර ආරවුල් පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යයේ බලය තහවුරු කර ගැනීමට මඟ පෑදුවේ ය.'' මෙම ප්‍රකාශය කරුණු 2 ක් වත් ආශ්‍රයෙන් ඔප්පු කරන්න.

(4) ''උඩරට රාජ්‍යය තුළ ද තම බලය තහවුරු කර ගැනීම පිණිස නිරන්තර උත්සාහයක පෘතුගීසීහු යෙදී සිටියහ.'' අවස්ථා 2 ක් ආශ්‍රයෙන් මෙම කියමන ඔප්පු කරන්න.

08 (1) දේශපාලන බලය මධ්‍යගත වූ මුල් කාලයේ දී රජවරුන් විසින් ආරෝපණය කරගත් රාජත්ව සංකල්ප 3 ක් නම් කරන්න.

(2) එකල රාජ්‍ය පරිපාලන සැකැස්මට සම්බන්ධ වූ නිලධාරීන් වර්ග 4 ක් සඳහන් කරන්න.

(3) විමධ්‍යගතව පැවැති දේශපාලනය මධ්‍යගත ව්‍යාපාරයකට පත්කිරීම සඳහා දුටුගැමුණු රජතුමාගෙන් ඉටුවූ සේවාව පහදන්න.

(4) පූර්ව රාජ්‍ය සමයේ මෙරට ගමක සැකැස්ම කවර ආකාර වීදැයි විස්තර කරන්න.

(01) (අ) (1) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම.




(01) (අ) (2) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම.




The National e-learning Portal for The General Education